ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

---

# 1996 අංක 31 දරන
# ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සඳහා වූ ගුවන් තොටුපළ වලදී සිදු කරනු ලබන නීති විරෝධී ප්‍රචණ්ඩ ක්‍රියා මැඩපැවැත්වීම පනත

---

[සහතිකය සටහන් කළේ 1996 නොවැම්බර් මස 12 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1996 නොවැම්බර් මස 15 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : ශත 60 යි. තැපැල් ගාස්තුව : රු. 2.00

# 1996 අංක 31 දරන ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සඳහා වූ ගුවන් තොටුපළවලදී සිදු කරනු ලබන නීති විරෝධී ප්‍රචණ්ඩ ක්‍රියා මැඩපැවැත්වීම පනත

[සහතිකය සටහන් කළේ 1996 නොවැම්බර් මස 12 වන දින.]

**එල්. ඩී.—ඕ 41/89.**

**සිවිල් ගුවන් සේවාවල ආරක්ෂාවට එරෙහිව සිදු කරනු ලබන නීති විරෝධී ක්‍රියා මැඩපැවැත්වීම සඳහා ද, 1971 සැප්තැම්බර් මස 22 වන දින මොන්ට්‍රියල් හිදී අත්සන් කරන ලද සම්මුතියට පරිපූර්වකව, ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සඳහා වූ ගුවන් තොටුපළවල දී සිදු කරනු ලබන නීති විරෝධී ප්‍රචණ්ඩ ක්‍රියා මැඩපැවැත්වීම සඳහා වූ ජාත්‍යන්තර ගිවිසුම් කෙටුම්පත බලාත්මක කිරීම ද ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික වූ කාරණා සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

සිවිල් ගුවන් සේවාවල ආරක්ෂාවට එරෙහිව සිදුකරනු ලබන නීති විරෝධී ක්‍රියා මැඩපැවැත්වීම සඳහා වර්ෂ එක් දහස් නවසිය හැත්තෑ එකේ සැප්තැම්බර් මස විසි තුන්වන දින මොන්ට්‍රියල්හි දී අත්සන් කරන ලද සම්මුතියට පරිපූර්වකව ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සඳහා වූ ගුවන් තොටුපළවල දී සිදු කරනු ලබන නීති විරෝධී ප්‍රචණ්ඩ ක්‍රියා මැඩ පැවැත්වීම සඳහා වූ ජාත්‍යන්තර ගිවිසුම් කෙටුම්පත වර්ෂ එක් දහස් නවසිය අසූ අටේ පෙබරවාරි මස විසි හතර වන දින මොන්ට්‍රියල් හිදී අත්සන් කරනු ලැබූ හෙයින් ද ;

සිවිල් ගුවන් සේවාවල ආරක්ෂාවට එරෙහිව සිදු කරනු ලබන නීති විරෝධී ක්‍රියා මැඩපැවත්වීම සඳහා 1971 සැප්තැම්බර් මස 23 වන දින මොන්ට්‍රියල් හි දී අත්සන් කරන ලද (මෙහි මින් මතු "සම්මුතිය" යනුවෙන් සඳහන් කරනු ලබන) සම්මුතියට පරිපූර්වකව ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සඳහා වූ ගුවන් තොටුපළවල දී සිදු කරනු ලබන නීති විරෝධී ප්‍රචණ්ඩ ක්‍රියා මැඩපැවැත්වීම සඳහා වූ එකී ජාත්‍යන්තර ගිවිසුම් කෙටුම්පතට, ශ්‍රී ලංකාවේ ආණ්ඩුව, එක් දහස් නවසිය අසූ අටේ ඔක්තෝබර් මස විසි අට වන දින එකඟ වූ බැවින් ද ;

සම්මුතිය ශ්‍රී ලංකාවෙහි බලාත්මක කිරීමට නෛතික විධිවිධාන සලස්වනු ලැබ ඇති හෙයින් සහ එකී ජාත්‍යන්තර ගිවිසුම් කෙටුම් පතේ විධිවිධාන ශ්‍රී ලංකාවේ දී බලාත්මක කිරීමට තවදුරටත් නෛතික විධිවිධාන සලස්වනු ලැබීමට අවශ්‍ය වන හෙයින් ද ;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් පහත සඳහන් පරිදි මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත, 1996 අංක 31 දරන ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සඳහා වූ ගුවන් තොටුපළවල දී සිදු කරනු ලබන නීති විරෝධී ප්‍රචණ්ඩ ක්‍රියා මැඩපැවැත්වීම සඳහා වූ පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, එකී පනත, ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සඳහා වූ ගුවන් තොටුපළවල දී සිදු කරනු ලබන නීති විරෝධී ප්‍රචණ්ඩ ක්‍රියා මැඩපැවැත්වීම සඳහා එක් දහස් නවසිය අසූ අටේ පෙබරවාරි මස විසි හතර වන දින මොන්ට්‍රියල් හි දී අත්සන් කරන ලද ජාත්‍යන්තර ගිවිසුම් කෙටුම්පත ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් බලාත්මක වන දිනය වශයෙන් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් සහතික කරනු ලබන දිනයකදී ක්‍රියාත්මක විය යුතුය. *(ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.)*

## I වන කොටස

සම්මුතියට අදාළ රටවල් අමාත්‍යවරයා විසින් සහතික කළ යුතු බව.

2. සම්මුතියට පාර්ශ්වකරුවන් වන රටවල්, අමාත්‍යවරයා විසි ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් කලින් ක සහතික කරනු ලැබිය හැකි ය. මේ වගන්තිය යටතේ සාදන ල නියමයක් බලාත්මක වන්නේ යම් රටක් සම්බන්ධයෙන් ද එ රට මෙහි මින් මතු "සම්මුතියේ රටක්" යනුවෙන් සඳහ කරනු ලැබේ.

සිවිල් ගුවන් සේවාවල ආරක්ෂාවට එරෙහිව සිදු කරනු ලබන වැරදි.

3. නීති විරෝධී ලෙස හා සිතාමතා ම යම් උපකරණයක්, ද්‍ර යක් හෝ ආයුධයක් පාවිච්චි කරමින්—

(අ) ශ්‍රී ලංකාව ඇතුළත හෝ පිටත හෝ වුව ද ජාත්‍යන්තර සිවි ගුවන් සේවා සඳහා වූ ගුවන් තොටුපළක ආරක්ෂාව අනතුරුදායක ක්‍රියාවක් හෝ අනතුරුදායක විය හැ ක්‍රියාවක් වන්නා වූ ද, යම් තැනැත්තකුට බරපත තුවාල හෝ මරණය සිදු කරන නැතහොත් බරපතල තුවා හෝ මරණය සිදුවීමට ඉඩ ඇති ක්‍රියාවක් වන්නා වූ ද ය ප්‍රචණ්ඩ ක්‍රියාවක් සිදු කරන ; හෝ

(ආ) ශ්‍රී ලංකාව ඇතුළත හෝ පිටත හෝ වුව ද ජාත්‍යන්තර සිවි ගුවන් සේවා සඳහා වූ ගුවන් තොටුපළක ආරක්ෂාව අනතුරුදායක ක්‍රියාවක් හෝ අනතුරුදායක විය හැ ක්‍රියාවක් වන්නා වූ එම ගුවන් තොටුපළේ පහසුක විනාශ කරන හෝ එම පහසුකම්වලට බරපතල හානි කරන හෝ ඒ ගුවන් තොටුපළෙහි නවතා ඇති සේවය නොවන ගුවන් යානයක් විනාශ කරන හෝ එයට පතල හානි සිදු කරන හෝ එම ගුවන් තොටුපළේ සේ කඩාකප්පල් කරන,

යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය අතර අධිචෝදනා පත්‍රයක් මත මහාධිකරණය ඉදිරියේ පැවැත්ව නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී අවුරුදු පහළොව දක්වා දීර්ඝ විය හැකි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් අ රයක බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් දෙලක්ෂය නොඉක්මවන දඩයකට හෝ බන්ධනාගාරගත කිරීම හා දඩය දඬුවම් දෙකට ම හෝ ඒ තැනැත්තා යටත් විය යුතු ය.

මහාධිකරණයේ අධිකරණ බලය.

4. (1) මේ පනත යටතේ වූ යම් වරදක් විභාග කිරීමේ හා ණය කිරීමේ අධිකරණ බලය ශ්‍රී ලංකාවේ මහාධිකරණය වෙත මෙයි පවරනු ලැබේ.

(2) (1) වන උපවගන්තිය මගින් මහාධිකරණය වෙත පව ලබන අධිකරණ බලය, කොළඹ දී පවත්වනු ලබන ශ්‍රී ලංකාවේ මහ කරණය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

සාක්ෂි.

5. මේ පනත යටතේ වූ වරදක් සම්බන්ධයෙන් යම් නඩු ප මක දී, විදේශ කටයුතු පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයාගේ ත්‍යාංශයේ ලේකම්වරයාගේ අත්සනින් වූ සහතිකයක් වන

සහතිකයේ විස්තර කර ඇති ගුවන් තොටුපළ, ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සඳහා වූ ගුවන් තොටුපළක් බවට වූ සහතිකයක් වැඩිදුර ඔප්පු කිරීමකින් තොරව සාක්ෂි වශයෙන් ආවේශ්‍ය කර ගත හැකි අතර, එහි එය ප්‍රකාශිත කාරණා සම්බන්ධයෙන් මුල් බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය.

## II වන කොටස

6. ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උද්ධෘත පනතේ උපලේඛනයේ ආ කොටසට පෙරාතුව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන් ඒ පනතේ ඒ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උද්ධෘත පනත සංශෝධනය කිරීම.

39. (අ) 1996 අංක 31 දරන ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සඳහා වූ ගුවන් තොටුපළවල දී සිදුකරනු ලබන නීති විරෝධී ප්‍රචණ්ඩ ක්‍රියා මැඩපැවැත්වීම සඳහා වූ පනතේ, අර්ථානුකූලව, ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සඳහා වූ ගුවන් තොටුපළක දී යම් තැනැත්තකුට එරෙහිව යම් උපකරණයක්, ද්‍රව්‍යයක් හෝ ආයුධයක් පාවිච්චි කරමින් එම ගුවන් තොටුපළේ ආරක්ෂාවට, අනතුරුදායක ක්‍රියාවක් හෝ අනතුරුදායක විය හැකි ක්‍රියාවක් වන එම තැනැත්තාට බරපතල තුවාල සිදු කරන හෝ ඔහුගේ මරණය සිදුකරන නැතහොත් බරපතල තුවාල හෝ මරණය සිදු කිරීමට ඉඩ ඇති යම් ප්‍රචණ්ඩ ක්‍රියාවක් ;

(ආ) 1996 අංක 31 දරන ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සඳහා වූ ගුවන් තොටුපළවල දී සිදු කරනු ලබන නීති විරෝධී ප්‍රචණ්ඩ ක්‍රියා මැඩ පැවැත්වීම සඳහා වූ පනතේ අර්ථානුකූලව, ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සඳහා වූ ගුවන් තොටුපළක ආරක්ෂාවට අනතුරුදායක ක්‍රියාවක් හෝ අනතුරුදායක විය හැකි ක්‍රියාවක් වන්නා වූ එම ගුවන් තොටුපළේ පහසුකම් විනාශ කිරීම හෝ එම පහසුකම්වලට බරපතල හානි සිදු කිරීම හෝ ඒ ගුවන් තොටුපළේ නවතා ඇති සේවයේ නොවන ගුවන් යානයක් විනාශ කිරීම හෝ එයට බරපතල හානි සිදු කිරීම, එම පහසු

කම්වලට හෝ ගුවන් යානා හෝ එම ගුවන් තොටුපළේ සේවා කඩාකප්පල් කිරීම.

**පවත්නා උදර්පන වැඩ පිළිවෙලවල් උපලේඛනයේ ඇති වැරදි සම්බන්ධයෙන් විධිවිධාන සලස්වන බවට සලකනු ලැබිය යුතු බව.**

7. ශ්‍රී ලංකාවේ ආණ්ඩුව සහ සම්මුතියේ රටක් අතර උදර්පන වැඩ පිළිවෙලක් බලාත්මකව පවත්නා අවස්ථාවක දී, ඒ වැඩ පිළිවෙලට ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උදර්පන පනතේ කාර්ය සඳහා, මේ පනතේ උපලේඛනයෙහි දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් උදර්පනය කිරීම සඳහා විධිවිධාන ද ඇතුළත් වන්නේ යයි සලකනු ලැබිය යුතු ය.

**උපලේඛනයෙහි ඇති වැරදි සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව සහ සම්මුතියේ රටක් අතර උදර්පන වැඩ පිළිවෙලක් ලෙස අමාත්‍යවරයා විසින් සම්මුතිය සලකනු ලැබිය හැකි බව.**

8. ශ්‍රී ලංකාවේ ආණ්ඩුව සහ සම්මුතියේ රටක් අතර උදර්පන වැඩ පිළිවෙලක් බලාත්මකව නොපවත්නා අවස්ථාවක දී අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උදර්පන පනතේ කාර්ය සඳහා ජාත්‍යන්තර ගිවිසුම් කෙටුම්පතද ඇතුළු සම්මුතිය මේ පනතේ උපලේඛනයෙහි දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් උදර්පනය කිරීම සඳහා විධිවිධාන සලස්වමින් ශ්‍රී ලංකාවේ ආණ්ඩුව ඒ සම්මුතියේ රට සමග ඇති කර ගන්නා ලද උදර්පන වැඩ පිළිවෙලක් ලෙස සලකනු ලැබිය හැකිය.

**උදර්පනය කිරීම සඳහා ඉල්ලා ඇත්තේ යම් තැනැත්තන් සම්බන්ධයෙන් ද එම තැනැත්තන්ට විරුද්ධව ගනු ලබන පියවර පිළිබඳව ඉල්ලා සිටින රාජ්‍යයට දැනුම්දීම අමාත්‍යවරයාගේ යුතු කම බව.**

9. මේ පනතේ උපලේඛනයෙහි සඳහන් යම් වරදක් සම්බන්ධයෙන් චෝදනා ලැබ සිටින හෝ වරදකරු කරනු ලැබ ඇති යම් තැනැත්තකු උදර්පනය කිරීම සඳහා සම්මුතියේ රටක ආණ්ඩුව විසින් හෝ ආණ්ඩුව වෙනුවෙන් ශ්‍රී ලංකාවේ ආණ්ඩුව වෙත ඉල්ලීමක් කරනු ලැබූ අවස්ථාවක, ඒ වරද සම්බන්ධයෙන් ඒ තැනැත්තාට විරුද්ධව නඩු පැවරීම සඳහා හෝ ඔහු උදර්පනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් ගෙන ඇති හෝ ගැනීමට අදහස් කර සිටින පියවර පිළිබඳව ශ්‍රී ලංකාවේ ආණ්ඩුව වෙනුවෙන් අමාත්‍යවරයා විසින්, ඒ තැනැත්තා උදර්පනය කරන ලෙස ඉල්ලා සිටින රාජ්‍යයේ ආණ්ඩුව වෙත, වහාම දැනුම් දෙනු ලැබිය යුතු ය.

**අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.**

10. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

**උපලේඛනය** **(7 සහ 8 වන වගන්ති)**

1. ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සඳහා වූ ගුවන් තොටුපළක දී යම් තැනැත්තකුට බරපතල තුවාල හෝ මරණය සිදු කරන නැතහොත් බරපතල තුවාල හෝ මරණය සිදුවීමට ඉඩ ඇති ක්‍රියාවක් වන්නා වූ ද එම ගුවන් තොටුපළේ ආරක්ෂාවට අනතුරුදායක ක්‍රියාවක් හෝ අනතුරුදායක විය හැකි ක්‍රියාවක් වන්නා වූ ද යම් උපකරණයක්, ද්‍රව්‍යයක් හෝ ආයුධයක් පාවිච්චි කරමින් නීති විරෝධි ලෙස හා සිතාමතා සිදුකරනු ලබන යම් ප්‍රචණ්ඩ ක්‍රියාවක්.

2. නීති විරෝධී ලෙස හා සිතාමතා ම හා යම් උපකරණයක්, ද්‍රව්‍යයක් හෝ ආයුධයක් පාවිච්චි කරමින් ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සඳහා වූ ගුවන් තොටුපළක ආරක්ෂාවට අනතුරුදායක ක්‍රියාවක් හෝ අනතුරුදායක විය හැකි ක්‍රියාවක් වන්නා වූ ද, එම ගුවන් තොටුපළේ පහසුකම් හෝ එම ගුවන් තොටුපළෙහි නවතා ඇති සේවයේ නොවන ගුවන් යානයක් විනාශ කිරීම හෝ එයට බරපතළ හානි සිදු කිරීම හෝ ගුවන් තොටුපළේ සේවා කඩාකප්පල් කිරීම.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත් වල සහ පනත් වල වාර්ෂික දායක මිල (දේශීය) රු.
(විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස් වර්ක් ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ
කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර. දායක මුදල් යො-
එලමෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.